# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,745 — 1959 මැයි 20 වැනි බදාදා — 20.5.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## IV වැනි කොටස—පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 461 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපළ විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 462 | මාර්ග කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | — |


## පළාත් පාලන නිවේදන

ජී. බී. 14/7/6.

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (201 වැනි පරිච්ඡේදයේ) 22 වැනි වගන්තිය යටතේ ඒ සඳහා නියමිත බල මණ්ඩලය විසින්—එනම්: ගාලු දිස්ත්‍රික්කයේ බෝපේ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය්‍ය සභාව විසින් සම්පාදිතව, 1947ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් එතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර ස්ථිර කරන ලද නියෝග.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්‍ය්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 මැයි මස 7 වැනි දින,
කොළඹදීය.

#### නියෝග

1. මේ නියෝගවල—

"සභාපතිතුමා" යනුවෙන් කාර්‍ය්‍ය සභාවේ සභාපති තුමා අදහස් කරනු ලැබේ;

"කාර්‍ය්‍ය සභාව" යනුවෙන් ගාලු දිස්ත්‍රික්කයේ බෝපේ ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය්‍ය සභාව අදහස් කරනු ලැබේ.

"මස් පිණිස සතුන් මරණ ස්ථානය" යනුවෙන් ආඥාපණතේ 21 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත්කරන ලද මස් පිණිස සතුන් මරණ පොදු ස්ථානය අදහස් කරනු ලබන අතර, ඊට මස් පිණිස සතුන් මැරීම සඳහා කාර්‍ය්‍ය සභාව විසින් නියම කරනු ලබන ස්ථානයක් ඇතුළත් කරනු ලැබේ.

2. මස් පිණිස සතුන් මරන සෑම ස්ථානයක්ම සෞඛ්‍ය පරීක්ෂක තැන භාරයේ තිබිය යුතුයි. එකී සතුන් මරන ස්ථානයෙහි මනා පරිපාලනය හා සනීපාරක්ෂාව සම්බන්ධයෙන් එකී නිලධාරි තැන විසින් වගකිව යුතුයි.

3. (1) කිසිම අයකු විසින් කිසිම සතකු —

(අ) ඒ සතා පරීක්ෂාකර බැලීම පිණිස කාර්‍ය්‍ය සභාව විසින් පත් කරන ලද නිලධාරිතැන විසින් පරීක්ෂාකොට මිනිසුන්ගේ ආහාර පිණිස මරනු ලැබීමට සුදුසුයයි අනුමතකර තිබේ නම්, හෝ

(ආ) පූ. භා. 7ටත් 9ටත් අතර කාලයේදී හෝ මිස නැත්නම් සතුන් මරන ස්ථානයේදී නොමැරිය යුතුයි; එහෙත් කවර අවස්ථාවකදී වුවත් මෙහි සඳහන් වේලාවට වඩා වෙනස්වූ යම් වේලාවක යම් සතකු මැරීම සඳහා ප්‍රධාන තුමා විසින් බලය දිය හැකියි.

(2) කිසිම අයකු විසින් කිසිම සතකු —

(අ) (1) වැනි ඡේදය යටතේ ඒ සතා මැරීම සඳහා අනුමතකළ වේලාවේ සිට පැය 72ක කාලයක් ගතවූවාට පසු කොයියම් වේලාවක, හෝ

(ආ) (1) වැනි ඡේදය යටතේ අනුමත කළාට පසු ඒ සතා සතුන් මරන ස්ථානයට අයිති භූමියෙන් පණ පිටින් ඉවත් කර ඇත්තේ නම්,

ඒ සතා නැවතත් පරීක්ෂාකොට මිනිසුන්ගේ ආහාර පිණිස මරනු ලැබීමට සුදුසුයයි (1) වැනි ඡේදය යටතේ අනුමත කරන ලද්දේ නම් මිස නැත්නම් සතුන් මරන ස්ථානයේදී නොමැරිය යුතුයි.

4. සතුන් මරන ස්ථානයට යම් සතකු ගෙන එන සෑම අයකු විසින්ම ඒ සතා සතුන් මරන ස්ථානයට අයිති භූමිභාගයෙහි නවත්වා සිටින කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම, බීම නිසැකවම ලැබීම සඳහා අවශ්‍යවූ සෑම පිළිවෙතක්ම යොදාගත යුතුයි.

5. සතුන් මරන ස්ථානයට යම් සතකු ගෙන එන සෑම අයකු විසින්ම ඒ සතා මරනු ලැබීමට සුදුසු නැතැයි ප්‍රතික්ෂේප කරන ලද්දේ නම් එසේ ප්‍රතික්ෂේප කළ වහාම ඒ සතා ඒ ස්ථානය පිහිටි භූමිභාගයෙන් ඉවත් කළ යුතුයි. නැතහොත් ඉවත් කරවිය යුතුයි.

6. යම් සතකු 3 වැනි නියෝගය යටතේ මැරීමට සුදුසුයයි අනුමත කළාට පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ගේ ආහාර පිණිස මරනු ලැබීමට නුසුදුසු බව පෙනී ගියොත් සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරිතුමා විසින් හෝ 3 වැනි නියෝගයේ සඳහන් නිලධාරී තැන විසින් හෝ ඒ සතා මැරීම තහනම් කළ හැකියි.

7. සතුන් මරන ස්ථානයේදී මරනලද යම් සතකුගේ මස් හෝ අතුනුබහන් ආදිය සෞඛ්‍යය වෛද්‍ය නිලධාරිතුමාගේ නොහොත් 3 වැනි නියෝගයේ සඳහන් වූ නිලධාරී තැනගේ කල්පනාවේ හැටියට ලෙඩ සහිතව හෝ මිනිසුන්ගේ ආහාරයට නුසුදුසුව තිබේනම් එතුමා විසින් ඒ මස් හෝ අතුනුබහන් ආදිය වහාම විනාශකර දැමීමට සැලැස්විය යුතුයි. එසේ නැතහොත් ඒ මස් හෝ අතුනුබහන් ආදිය විකිණීම පිණිස තැබීම හෝ මිනිසුන් විසින් ආහාර පිණිස ගැනීම හෝ වලකින අන්දමින් ඉවත් කරවිය යුතුයි.

8. සතුන් මරණ ස්ථානය භාරවූ නිලධාරී තැන විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසුයයි අනුමතකර නැත්තාවූ හෝ 6 වැනි නියෝගයේ විධිවිධාන පරිදි මැරීම තහනම් කර තිබෙන්නාවූ හෝ කිසිම සතකු මස් පිණිස මැරීමට අවසර නොදිය යුතුයි.

9. (1) කිසිම අයකු විසින් මිනිසුන්ගේ ආහාරයට නුසුදුසුයයි 7 වැනි නියෝගය යටතේ ප්‍රකාශ කරන ලද කිසිම මසක් හෝ අතුනුබහන් ආදියක් සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරිතුමාගේ නොහොත් 3 වැනි නියෝගයේ සඳහන් වූ නිලධාරී තැනගේ නියමය යටතේ මිස නැත්නම් සතුන් මරණ ස්ථානයෙන් ඉවත් නොකළ යුතුයි.

(2) කිසිම අයකු විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස අදහස් කරන ලද යම් සතකුගේ කුණපය, ඒ කුණපයේ ඉස් සරහ ගාත්වලත් පස්ස ගාත්වලත් සතුන් මරන ස්ථානය භාරවූ නිලධාරී තැන විසින් "බෝපේ ග. ස." යන මුද්‍රාව පිහිටුවා තිබේනම් මිස නැත්නම් සතුන් මරණ ස්ථානයෙන් හෝ සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථානවලින් ඉවත් නොකළ යුතුයි.

10. වෙනත් යම් සතකු ඉදිරියේදී හෝ ඒ ස්ථානයෙහි කලින් මරන ලද සෑම සතකුගේම කුණපය ඉවත් කර හෝ මුවාකර ස්ථාන ශුද්ධ පවිත්‍ර කරන තුරු හෝ කිසිම සතකු නොමැරිය යුතුයි.

11. (1) කාරණයේ හැටියට සතුන් මරන ස්ථානය පාවිච්චිකිරීම සඳහා පහත සඳහන් වන අන්දමේ ගාස්තුවක් කාරක සභාවට කලින් ගෙවිය යුතුයි. ගාස්තුව ගෙවූ බවට සාක්ෂ්‍යයක් වශයෙන් කාරක සභාවේ කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් නැතුව කිසිම සතකු මැරීමට ඉඩ නොදිය යුතුයි :—

හරකුන් සඳහා එකකුට ... ... රු. 4.50
බැටළුවන්, එළුවන් හෝ ඌරන් සඳහා එකකුට ... රු. 2.00

(2) මිනිසුන්ගේ ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසු මෙන් 3 වෙනි නියෝගය යටතේ සතකු අනුමත කර තිබෙන විට ඒ සතා මස්මඩුවට ඇතුල් කිරීමට ප්‍රථමයෙන් ගාස්තුව ගෙවූ බවට සාක්ෂ්‍යයක් වශයෙන් කාරක සභාවේ කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් පෙන්වා සිටීම වුවමනා නොකෙරෙයි.

12. සතුන් මරන ස්ථානය භාර අය විසින් සතුන් මරන ස්ථානයට හෝ සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථානවලට ගෙන එන ලද සියළුම හරකුන් පිළිබඳ ලේඛණයක් මේ සමග තිබෙන ෆෝරම යෙහි පරිදි තබාගත යුතුයි :—

| හරක් කුවිතාන්සියේ නො. | විස්තර | පාට | වයස | හං නිවරන | | වෙළෙන්දාගේ නම | හරක් කොටුවට ඇතුල් කළ වෙලාව සහ දිනය | පරීක්ෂාකර බැලූ දිනය | ගෙනගිය දිනය | වැඩිපුර කරුණු | හරක් මරගන්නා නිලධාරී තැනගේ අත්සන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | දකුණු පැත්ත | වම පැත්ත | | | | | | |
| | | | | | | | | | | | |

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ජී—බී 150/46
ඇල්. ජී. ජී—ජී අයි 11/2 අයි

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාත හේවාහැට ගන්දහය උතුර ගම් ප්‍රදේශයේ ගම්කාරක සභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවැරී තිබෙන ප්‍රකාර එතුමා විසින් අනුම කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 මැයි මස 7 වැනි දින,
කොළඹදීය.

### රථවාහන හා සතුන් පිළිබඳ සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා

1. (1) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ අය කරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත් වූ යම් රථවාහනයක් හෝ සතෙක් අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබා ගෙන හෝ සිටින්නාවූ සෑම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් "ඒ" උපලේඛනයෙන් ප්‍රධාන තුමාට සැපයිය යුතුයි. මේ ෆෝරම ගම්කාරක සභා කාර්යාලයෙන් ලබාගත හැකිය.

(2) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින් 1959 වර්ෂය වෙනුවෙන් (1) වැනි ඡේදයේ සඳහන් උපලේඛනය සම්පූර්ණකොට 1959 යේ මැයි මස 31 වැනි දින හෝ ඊට මත්තෙන් හෝ ප්‍රධාන තුමා වෙත යැවිය යුතුයි. එකී අය විසින් ඒ වාහනය හෝ සතා හෝ අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන් එකී අයගෙන් එබඳු උපලෙඛනයක් අවශ්‍ය නැත.

2. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛන සැපයුවාවූ සෑම අයෙක්ම තව දුරටත් දැනුම් දෙනු ලැබීමක් නැතිව :—

(අ) ඒ උපලේඛනයේ සඳහන් රථවාහන සහ සතුන් සඳහාවූ බද්ද 1959 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ මාර්තු මස 31 වෙනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

තවද—

(ආ) ඊට පසු එක් එක් වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනයේ සඳහන් කරන ලදුව, එකී වර්ෂයේ දවස් තිහකට වැඩි කාලයක් තමා අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ එකී රථවාහන සහ සතුන් සඳහාවූ බද්ද එකී එක් එක් අවුරුද්දේ මාර්තු 31 වැනිදා හෝ ඊට මත්තෙන් ගෙවීමට යටත් වෙති.

3. (1) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාට පසු යම් කිසිවෙකු විසින් ඒ උපලේඛනයේ සඳහන් නොකරන ලද්දාවූ ආඥාපනත යටතේ බද්දට යටත්වූ ද යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් හෝ 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උපලේඛනයක් සපයා නැත්තාවූ යම් කිසිවෙකු විසින් එකී බද්දට යටත් යම් රථවාහනයක් හෝ සතෙකු පළමුවන වරට අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එවිට ඒ අය විසින් එබඳු යම් රථවාහන යක් හෝ සතෙකු අත්පත් කර ගැනීමේ හෝ තබා ගැනීමට නොහොත් පාවිච්චි කිරීමට පටන් ගැනීමේ දින සිට එක් මාසයක් ඇතුළතදී සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් "ඒ" උපලේඛනයේ සඳහන් ෆෝරමයේ ප්‍රකාරයට ලියවිල්ලකින් වූ දැන්වීමකින් එසේ අත්පත් කරගත් බව ප්‍රධානතුමාට දැනුම් දිය යුතුයි.

4. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම එකී ලේඛනය සැපයූ අවුරුද්ද වෙනුවෙන් ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන්ද එකී ලේඛනයේ සඳහන් කරනු ලැබ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනයේ පිට හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් පිළිබඳ බද්ද ඒ සඳහා ප්‍රධානතුමා විසින් තමාට දැනුම් දෙනු ලබන යම් කාල සීමාවක් ඇතුළතදී ගෙවීමට බැඳී සිටිති.

5. (1) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උප ලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයූවාට පසු ඒ උපලේඛනයට ඇතුළත් කළා වූ හෝ උප ලේඛනයේ සඳහන් කළා වූ හෝ යම් රථවාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥාපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම අයෙකු විසින්ම එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් හේතු නිසා යයි දැක්වෙන ලියවිල්ලකින් වූ දැන්වීමක් වහාම ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි.

(2) 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උප ලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය සැපයූවාට පසු ඒ රථවාහනය හෝ සතා තබා ගැනීමට හෝ පාවිච්චි කිරීම නතර කළා වූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත් හැරියාවූ සෑම අයෙකු විසින්ම ලියවිල්ලකින් වූ දැන්වීමකින් තමා ඒ සතා හෝ රථවාහනය තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම් අත් හළ බැව් වහාම ප්‍රධාන තුමා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

6. (1) යම් කිසිවෙකු විසින් බද්ද ගෙවූ විට ප්‍රධානතුමා විසින් ඒ බද්ද ගෙවූ රථවාහනය වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන් "බී" උපලේඛනයෙහි සඳහන් ෆෝර්මයේ ප්‍රකාරයට ඒ රථ වාහනය සඳහා වෙන් වශයෙන් යොදා ඇති විශේෂ අකුරුද තහඩුව නිකුත් කරන අවුරුද්ද දැක්වෙන ඉලක්කම්ද රථවාහන රිජිස්ටරයේ ඒ ඒ රථවාහන පිළිබඳ වූ අංකයද සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි.

(2) එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් ලෙසකින් හෝ නොපැහැදිළිව නොහොත් මැකී ගොස් තිබෙතොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් ඒ ප්‍රධානතුමාට ආපසු භාරදිය යුතුයි. තවද ඔහු, විසින් ශත පණහක් ගෙවූ විට ඔහුට අලුත් තහඩුවක් නැවත ලබා ගැනීමට අයිතිවාසිකම් තිබේ. එබඳු යම් තහඩුවක් නැතිවී හෝ සොරා ගෙන තිබෙන බව දිවුරුම් සහතිකයකින් හෝ වෙනයම් ලෙසකින් ප්‍රධානතුමාට ඒත්තු ගැනීමට සැලැස්වුව හොත් එතුමා විසින් අයිති කාරයාගේ ඉල්ලීම් පිටත් ඔහු විසින් ශත හැටක් ගෙවනු ලැබූ විටත් අළුත් තහඩුවක් නිකුත් කළ හැකියි.

7. සෑම රථවාහනයකම එම අවස්ථාවේ අයිතිකරු විසින් හෝ භාර කරු විසින් 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව ඒ රථවාහනයේ කාටත් පෙනෙන තැනක සවි කළ යුතුයි.

8. ප්‍රධානතුමා විසින් හෝ ආදායම් ඕවර්සියර්වරයෙකු විසින් හෝ පොලිස් නිලධාරියෙකු විසින් හෝ ප්‍රධාන තුමාගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනාගමනයෙහි යෙදී තිබෙන රථවාහනයක් ද ඒ රථවාහන යෙහි 7 වැනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර සවිකොට තිබිය යුතු තහඩුව පරීක්ෂාකර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යානුකූල වන්නේය. තවද ප්‍රධානතුමා විසින් හෝ එබඳු වෙනත් නිලධාරියා විසින් ඉල්ලීමක් කර සිටි කල්හි එකී ඕනෑම රථයක එම අවස්ථාවේදී භාරකාරයා විසින් හෝ රථය පදවන්නා විසින් හෝ රථය නවත්වා ප්‍රධානතුමාට හෝ එකී නිලධාරියාට එකී තහඩුව පරීක්ෂාකර බැලීමට ඉඩදිය යුතුයි.

9. මේ අතුරු ව්‍යවස්ථාවල —

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්‍ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ;

"කාර්‍ය සභාව" යනුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ පාතහේවාහැට ගන්දහය උතුරු ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ;

"ආඥාපනත" යනුවෙන් ගම්සභා ආඥාපනත (198 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

"ඒ" උපලේඛනය

**ෆෝර්මය**

අංකය :————.

ජන්දදායක කොට්ඨාශ අංකය :————.

**පාත හේවාහැට ගන්දහය උතුර ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව**

රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් වූ අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාරයට සැපයිය යුතු රථවාහන හා/හෝ සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකාරයාගේ නම :————.

ගම :————.

| රථවාහන හා/හෝ සතුන් පිළිබඳ විස්තරය | ගණන (වචන වලින්) | වෙනත් විස්තර (බයිසිකලයක් නම් සාදන ලද අයගේ නොම්මරය සඳහන් කරනු) |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ කරත්ත හැර වෙන ඕනෑම අන්දමක වාහන ... | | |
| ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින බර කරත්ත හෝ තිරික්කල ... | | |
| තනි ගොනා බඳින බර කරත්ත හෝ තිරික්කල ... | | |
| ජින් රික්ෂෝ කරත්ත ... | | |
| අත් කරත්ත ... | | |
| බයිසිකල් ... ... | | |
| අලි ... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... | | |

මගේ දැනීම හැටියට ඉහත සඳහන් ලේඛනය නිවැරදි බවටත්, සත්‍ය බවටත් සහතික කරමි.

————,

අයිතිකරුගේ අත්සන.

දිනය :————.

"බී" උපලේඛනය

**ෆෝර්මය**

| | |
|---|---|
| කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ කරත්ත හැර වෙන ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... ... | ග. උ. වා. |
| ඕනෑම අන්දමක සෑම ගොන් දෙන්නා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... | ග. උ. බ. ක. |
| සෑම තනිගොනා බඳින බරබාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | ග. උ. ක. |
| සෑම ජින් රික්ෂෝ කරත්තයක් සහ සෑම අත් කරත්තයක් සඳහා ... ... | ග. උ. අ. ක. |
| සෑම බයිසිකලයක් සඳහා ... ... | ග. උ. බ. |

---

ඇල්. ඩී.—බී 29/47.
ඇල්. ජී. ඩී.—ජී. අයි. 11/1.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාතහේවාහැට හේවාවිස්ස කෝරළේ ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 මැයි මස 12 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

1955ගේ ජූනි මස 24 වැනි දින අංක 10,810 දරණ ගැසට් පත්‍රයේ පළවූ අන්තරායදායකවූ හා අප්‍රසන්නවූ කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථා, එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) "තොග ගණනේ විකිණීම සඳහා නරක්වන සුළු ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම" යන කාරණය අස්කොට ඒ වෙනුවට, "තොග ගණනේ හෝ සිල්ලරට හෝ විකිණීම සඳහා නරක්වන සුළු ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම" යන කාරණය යෙදීමෙන් " හා,

(2) "බීඩි කර්මාන්තය" යන කාරණය එක්කම ඊළඟට පහත සඳහන් අළුත් කාරණා යෙදීමෙන් ද වේ.

"යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් මිරිස් සහ තුනපහ වර්ග ඇඹරීම".
"සෝඩා ලැමනේඩ් ආදී සිසිල් බීම සෑදීම සඳහා ස්ථානයක් තබාගැනීම".

අංකය : ජී. බී. 14/11/7.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වෙනි පරිච්ඡේදයේ) 49 වෙනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ වඳුරඹ ගම්ප්‍රදේශයේ ගම්කාරක සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරන "ගැසට් අතිරේකයේ" පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 මැයි මස 7 වැනි දින,
කොළඹදිය.

### ගොඩනැගිලි හා තාප්ප සෑදීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. (I) කිසිවකු විසින් ගම් ප්‍රදේශය තුළ—

(අ) ඕනෑම ගම්සභා පාරක් මැද සිට අඩි පහළොහක දුර ප්‍රමාණයක් ඇතුළත, හෝ

(ආ) ඕනෑම ගම්බද කරත්ත පාරක් මැද සිට අඩි පහළොහක දුර ප්‍රමාණයක් ඇතුළත, හෝ

(ඇ) යථා කාලයේදී ගම්බද කරත්ත පාරක් බවට පත් කරනු ලැබිය හැකියයි කාර්ය සභාව විසින් දැනුම් දෙනු ලැබුවාවූ ඕනෑම ගම්බද පාරක් මැද සිට අඩි පහළොහක දුර ප්‍රමාණයක් ඇතුළත, හෝ

(ඈ) මේ අතුරු ව්‍යවස්ථාවේ (ඇ) උප ඡේදයේ සඳහන් කරන ලද අඩි පාරකින් බාහිරවූ ඕනෑම ගම්බද අඩිපාරක් හෝ දෙවට පාරක් මැද සිට අඩි හතක දුර ප්‍රමාණයක් ඇතුළත අළුත් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදිය යුතු නැත.

(II) කිසිවකු විසින් ලියවිල්ලකින්වූ දැන්වීමකින් දවස් තිහකට කලින් ඒ පිළිබඳව ප්‍රධානතුමාට දැනුම් නොදී මේ අතුරු ව්‍යවස්ථාවේ (I) වෙනි ඡේදයේ සඳහන් කරන ලද ඕනෑම කරත්ත පාරක් හෝ අඩි පාරක් හෝ දෙවට පාරක් අයිනේ කිසිම ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදිය යුතු නැත.

2. මේ අතුරු ව්‍යවස්ථාවල.—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ ;

"කාර්ය සභාව" යනුවෙන් වඳුරඹ ගම් ප්‍රදේශයේ ගම්කාරක සභාව අදහස් කරනු ලැබේ ;

"අඩිපාර නොහොත් දෙවට පාර" යනුවෙන් පළලෙන් අඩි හතරකට අඩු නොවූ ද, අඩි හයකට වැඩි නොවූ ද පාරක් අදහස් කරනු ලැබේ ;

"ගම් ප්‍රදේශය" යනුවෙන් ගාලු දිස්ත්‍රික්කයේ වඳුරඹ ගම් ප්‍රදේශයේ අදහස් කරනු ලැබේ ;

"ගම්සභා පාර" යනුවෙන් ගම්කාරක සභාව මගින් නඩත්තු කරගෙන යනු ලබන්නාවූ ද පළලින් අඩි දහහතරකට වඩා අඩු නොවූ ද පාරක් අදහස් කරනු ලැබේ ;

"ගම්බද කරත්ත පාර" යනුවෙන් පළලින් අඩි නවයකට වඩා අඩු නොවූ පාරක් අදහස් කරනු ලැබේ.

---

අංකය : ජී. බී. 14/24/2.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වෙනි පරිච්ඡේදයේ) 49 වෙනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ බටපොළ ගම් ප්‍රදේශයේ ගම්කාරක සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලනය සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන අතුරු .ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 මැයි මස 7 වැනි දින,
කොළඹදිය.

### අතුරු ව්‍යවස්ථා

වර්ෂ 1955 අගෝස්තු මස 19 වෙනි දින අංක 10,828 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද අතුරු ව්‍යවස්ථා, ඊට යාකොට ඇති උප ලේඛනයේ "බී" පෝර්මය වෙනුවට, පහත සඳහන් අළුත් පෝර්මය යොදා මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"බී" පෝර්මය

| | |
|---|---|
| කරත්තයක්, තිරික්කලයක් හෝ ජින්රික්ෂෝ රථයක් හැර වෙනත් ඕනෑම අන්දමේ වාහනයක් සඳහා ... | බ. වා. |
| සෑම ගොන් දෙන්නා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | බ. බ. ක. |
| සෑම තනිගොනා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... | බ. බා. ක. |
| සෑම ජින්රික්ෂෝ කරත්තයක් සඳහා ... | බ. ජී. |
| සෑම බයිසිකලයක් සඳහා ... ... | බ. බ. |

---

## විශේෂ නිවේදනයයි

1959 ජූනි මාසයේ සිට, ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, ඊට කලින් සතියේ සඳුදා පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙනසේ එවිය යුතුවේ. සඳුදාත් සිකුරාදාත් අතරතුරදී ආණ්ඩුවේ නිවාඩු දිනයක් යෙදෙන්නේ නම් (දෙදිනම ඇතුළුව එම දැන්වීම් සෙනසුරාදා දවල් 12 ට ප්‍රථම ලැබෙන සේ එවිය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1959 මැයි 15 දින,
කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයේදීය.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.